**බස්නාහිර පළාත් සභාව - 2013**

**-------------------------------------**

බස්නාහිර පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම.**

**(අ) පළාත් සභා අරමුදල් ගිණුම**

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2014 මාර්තු 17 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

**(ආ) අනෙකුත් ගිණුම්**

2014 මාර්තු 31 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | 2013 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|
| | | **මුළු ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව** |
| (i). | විසර්ජන ගිණුම් | 27 | 27 | - |
| (ii). | ආදායම් ගිණුම් | 30 | 30 | - |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 38 | 38 | - |
| (iv). | වානිජ අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| (v). | වෙනත් අත්තිකාරම් ගිණුම් | 06 | 06 | - |
| (vi). | අරමුදල් ගිණුම් | 06 | 06 | - |
| (vii). | ප්‍රඥප්ති ගිණුම් | 09 | 08 | 01 |

### 2.2.2 ප්‍රතිපාදන කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 03 ක වැය විෂයයන් 10 ක් යටතේ වූ රු.100,224,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 12 ක වැය විෂයයන් 93 ක් යටතේ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදීම රු. 114,425,480 ක් විය.

(ඇ) ශීර්ෂ 03 ක වැය විෂයයන් වලින් ප්‍රතිපාදන අඩුකර ගැනීමෙන් පසු එම වැය විෂයයන් වලටම නැවත ප්‍රතිපාදන වැඩිකර ගැනීම් අවස්ථා 08 ක් තිබුණි.

(ඈ) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාලව වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම රු. 91,790,844 ක් විය.

### 2.2.3 අග්‍රිම ගිණුම්

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු. 474,645,582 ක්වූ අතර, එය හර එකතුව රු. 480,017,090 කින් හා බැර එකතුව රු. 5,371,508 කින් සමන්විත විය. ඒ අනුව ආයතන 05 කට අදාලව ලබාදී තිබූ අග්‍රිම සීමාවන් ඉක්මවා රු. 5,371,508 ක් පියවීම් කර තිබුණි.

### 2.2.4 ප්‍රේෂණ ගිණුම්

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිරවුල් නොකළ ප්‍රේෂණ ශේෂ එකතුව රු. 346,771,644 ක්වූ අතර, එය හර එකතුව රු. 350,892,106 කින් හා බැර එකතුව රු. 4,120,462 කින් සමන්විත විය.

### 2.2.5 පොදු තැන්පත්

2013 දෙසැම්බර් 31 දිනට පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ රු. 507,586,084 ක ශේෂයක් වූ අතර, මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාර කටයුතු නොකළ අවුරුදු 02 ඉක්මවා තිබූ ආයතන 11 ක තැන්පත් ශේෂ වල එකතුව රු. 3,773,558 ක් විය.

### 2.2.6 පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 20 ක දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින පළාත් සභා නිලධාරී අත්තිකාරම් ශේෂ එකතුව රු. 142,664,021 ක්වූ අතර, එයින් රු. 142,067,568 ක් අවුරුදු 04 සිට 10 දක්වා කාලයටද රු. 596,453 ක් අවුරුදු 10 කට වැඩි කාලයකටද අදාල විය.

### 2.2.7 ගණකාධිකරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ ආයෝජන පොලී ආදායම රු. 1,177,220,598 ක් වූවද අරමුදල් ගිණුමේ පෙන්වා තිබුණේ රු. 1,176,703,665 ක් බැවින් අත්හැරීම් රු. 516,933 ක් විය.

### 2.2.8 නොසැසඳූ පාලන ගිණුම්

ඒ ඒ දෙපාර්තමේන්තු වලින් ඉදිරිපත් කරන ලද ගිණුම් හා පළාත් සභා අරමුදල් ගිණුම (පළාත් භාණ්ඩාගාර පොත්) අතර පහත දැක්වෙන වෙනස්කම් තිබුණි.

| ගිණුම් විස්තරය | ඒ ඒ දෙපාර්තමේන්තු වල ගිණුම් අනුව ශේෂය | පළාත් සභා අරමුදල් ගිණුම අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අග්‍රිම ගිණුම් 13 ක් | 362,464,699 | 361,092,716 | 1,371,983 |
| පොදු තැන්පත් ගිණුම් 04 ක් | 13,442,607 | 7,008,698 | 6,433,909 |
| පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 07 ක් | 200,041,368 | 204,968,400 | 4,927,032 |
| ප්‍රේෂණ ගිණුම් 05 ක් | - | 1,745,154 | 1,745,154 |
| ආදායම් ගිණුම් 02 ක් | 87,570,983 | 85,730,504 | 1,840,479 |

### 2.2.9 ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම

පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබූ අතර එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සටහන්වලින්ද හෙළිදරව් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල වූ ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු. 1,517,043,269 ක පහත සඳහන් ස්ථාවර වත්කම් පළාත් සභාව සතුව තිබුණු බව තහවුරු කර තිබුණි.

| විස්තරය | වටිනාකම |
| --- | --- |
| | රු. |
| වාහන (2101) | 488,097,708 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (2102) | 345,081,740 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ (2103) | 359,516,792 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් (2104) | 93,901,072 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් (2105) | 1,913,931 |
| වෙනත් (2106) | 228,532,026 |
| | 1,517,043,269 |

**2.2.10 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

2014 ඔක්තෝබර් 31 දිනට පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 16 කට නිකුත් කර තිබූ විගණන විමසුම් 28 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.11 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදය | අභ්‍යන්තර විගණන අංශය සඳහා අනුයුක්ත කරගෙන තිබූ කළමනාකරණ සහකාරවරුන්ගේ තොරතුරු හා අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ රාජකාරි විස්තර ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1985 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට තදුවිත පදනම මත බඳවාගත් සේවකයින්ගේ මුළු ඉපයීම් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම නිසා 2012 වර්ෂයේදී රු. 1,960,018 ක් සේවක අර්ථසාධක අරමුදලට අඩුවෙන් බැර කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත | |
| | (i) 6(i)(අ) උප වගන්තිය | පිරිවැය රුපියල් මිලියන 05 ඉක්මවන කොන්ත්‍රාත් පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත කොන්ත්‍රාත්කරුවන් ලවා පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ යුතු වුවද පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ටෙන්ඩර් පිරිනමන ලද කොන්ත්‍රාත් 656 ක් එලෙස ලියාපදිංචි කර ඇති බවට තහවුරු කර නොතිබුණි. |
| | (ii) 12 වන වගන්තිය | පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි කළ බවට සහතිකයක් ඉදිරිපත් නොකළ කොන්ත්‍රාත් 656 කට අදාල ටෙන්ඩර්කරුවන් සමඟ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු කිරීම මත පනතේ 12 හා 08 වගන්තිවලට අනුව එකී නිලධාරීන් දඬුවම් ලැබිය යුතු වරදක් සිදුකර තිබුණි. |
| (ඈ) | 2010 සැප්තැම්බර් 01 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 446 | අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ හිමිකම් නොලබන නිලධාරීන්ගේ ජංගම දුරකථන බිල්පත් පියවීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 714,751 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 දරන චක්‍රලේඛය | විෂය ඉගැන්වීමේ නියුතු ගුරුභවතුන් සතියකට විනාඩි 40 කාලපරිච්ඡේද 35 ක් හා විෂය ඉගැන්වීමට අමතරව පන්තියක්ද භාරව ක්‍රියාකරන ගුරුභවතෙකු කාලපරිච්ඡේද 33 ක් ඉගැන්වීමේ කටයුතුවල නිරත විය යුතු වුවත් සපුගස්කන්ද විශාඛා බාලිකා විදුහලේ ගුරුභවතුන් 40 කට කාල සටහන් නොතිබූ බැවින් එම ගුරුභවතුන්ගේ කාර්ය සාධනය පරීක්ෂා කළ නොහැකි විය. |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 16.5 හා 16.6 වගන්ති | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරියකට විදේශ අධ්‍යයන නිවාඩු ලබාදීමේදී එළඹි ගිවිසුම හා බැඳුම්කරය ප්‍රකාරව රජයට අයවිය යුතු මුදලින් කොටසක් පමණක් අය කර ඇයව නිදහස් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (උ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ රු.27,740,949 ක් වටිනා පරිගණක යන්ත්‍ර හා උපාංග සහ රු. 3,799,606 ක් වටිනා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් පරිගණක වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඌ) | 2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 හි 04 ඡේදය | නිල වාහන අනුයුක්ත කර තිබූ උසස් නිලධාරීන් සංචිත වාහන භාවිතා කර තිබූ අවස්ථා තිබුණි. |
| (එ) | පළාත් සභා මූල්‍ය රීති 29(4)(ඔ) | පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන්කර ගෙන තිබූ ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කරගෙන තිබුණි. |
| (ඒ) | බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2012 ජූලි 06 දිනැති බ.ප./සා.ප./10 වා.ස්. මාරු 2013 දරන චක්‍රලේඛය | එක් පාසලක අඛණ්ඩව අවුරුදු 10 ක සේවා කාලයක් ඉක්මවූ ගුරුභවතුන් ස්ථාන මාරු කළයුතු වුවද කැළණිය අධ්‍යාපන කලාපයේ පාසැල් 19 ක ගුරුභවතුන් 65 දෙනෙකු අවුරුදු 10 කට වැඩි කාලයක් එකම පාසලේ සේවය කරමින් තිබුණි. |
| (ඔ) | බස්නාහිර පළාත් මූල්‍ය රීති 54 | පානදුර මූලික රෝහලේ සිදුව තිබූ රු.14,438,204 ක් වටිනා වාහන අලාභ හානි සිද්ධි 15 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |

## 3 ආදායම් හා වියදම් කළමනාකරණය

### 3.1 ආදායම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විචලනයන් සහිත සාරාංශයක් පහත දැක්වේ.

| | 2013 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| පළාත් සභා විෂයන්ට අදාල ආදායම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම් | 27,302,025,000 | 22,262,325,180 | 5,039,699,820 | 23,046,025,000 | 22,156,276,464 | 889,748,536 |
| බදු නොවන ආදායම් | 2,815,230,000 | 3,259,241,399 | (444,011,399) | 2,832,661,000 | 3,947,231,780 | (1,114,570,780) |
| රජයේ ප්‍රදාන | 11,490,501,000 | 11,367,755,000 | 122,746,000 | 12,485,622,000 | 9,691,181,000 | 2,794,441,000 |
| එකතුව | 41,607,756,000 | 36,889,321,579 | 4,718,434,421 | 38,364,308,000 | 35,794,689,244 | 2,569,618,756 |

### 3.2 වියදම්

| | 2013 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| වියදම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 22,832,178,812 | 22,220,542,279 | 611,636,533 | 20,930,855,026 | 20,486,662,368 | 444,192,658 |
| අනෙකුත් | 12,583,219,117 | 12,212,444,426 | 370,774,691 | 11,165,099,626 | 10,871,786,649 | 293,312,977 |
| පුනරාවර්තන | 35,415,397,929 | 34,432,986,705 | 982,411,224 | 32,095,954,652 | 31,358,449,017 | 737,505,635 |
| ප්‍රාග්ධන | 6,192,358,071 | 5,054,877,130 | 1,137,480,941 | 6,268,353,348 | 5,465,520,960 | 802,832,388 |
| එකතුව | 41,607,756,000 | 39,487,863,835 | 2,119,982,165 | 38,364,308,000 | 36,823,969,977 | 1,540,338,023 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම් අනුපාතය 7 :1 ක් විය.

## 3.3 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට හා ආසන්නතම ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2013 | 2012 | 2011 |
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 769,607,586 | 1,138,048,276 | 1,426,690,111 |
| බදු නොවන ආදායම | 764,074,279 | 394,127,295 | 1,248,958,145 |
| | 1,533,681,865 | 1,532,175,571 | 2,675,648,256 |

## 4. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 2,598,542,256 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,029,280,733 ක් විය.

### 4.2 නෛතික සිද්ධි

පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව / අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි කිහිපයක් පහත දැක්වේ.

(අ) මාර්ග සංවර්ධනය කිරීමේදී පෞද්ගලික දේපළවලට අලාභ සිදුවීම හා පෞද්ගලික දේපළ නීතිවිරෝධී ලෙස අත්පත් කර ගැනීම නිසා එකතුව රු. 4,907,875 ක වන්දි ඉල්ලා බාහිර පුද්ගලයන් 05 දෙනෙකු විසින් අධිකාරියට එරෙහිව අධිකරණවල නඩු 05 ක් ගොනුකර තිබුණි. ඉන් එක් නඩුවක නිශ්චිත වන්දියක් ඉල්ලා නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම් අවලංගු කිරීම හා ගිවිසුම් කොන්දේසි පැහැර හැරීම නිසා එකතුව රු.99,457,658 ක් වන්දි ඉල්ලා බාහිර ආයතන 02 ක් විසින් අධිකාරියට එරෙහිව අධිකරණවල නඩු 02 ක් ගොනුකර තිබුණි.

(ඇ) අධිකාරියේ රියදුරෙකු විසින් කළ රිය අනතුරක් හේතුවෙන් පාදය අහිමි වූ බාහිර පුද්ගලයෙකු රු. 350,000 ක් වන්දි ඉල්ලා අධිකාරියට එරෙහිව අධිකරණයක නඩුවක් ගොනුකර තිබුණි.

(ඈ) සේවය නියුක්තව සිටි සේවකයෙකුගේ සේවය අවසාන කිරීම නිසා එම සේවකයා අධිකාරියෙන් වන්දියක් හා නැවත සේවයේ පිහිටුවීම ඉල්ලා කම්කරු විනිශ්චය සභාවේ ගොනු කළ නඩුවකදී සේවකයාට රු. 570,140 ක් ගෙවීමට සිදුව තිබුණි.

(ඉ) අධිකාරියේ හිටපු ගණකාධිකාරීවරයෙකු විසින් සේවයේ නියුක්තව සිටි කාලයේදී ලබාගත් වාහන ණය රු. 479,819 ක් හා ඊට අදාල හිඟහිටි ණය පොලිය රු. 69,917 ක් වශයෙන් එකතුව රු. 549,736 ක් ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් එම හිඟ ණය ශේෂය හා පොලිය අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් අධිකරණයක නඩුවක් ගොණුකර තිබුණි.

## 5. මෙහෙයුම් සමාලෝචනය

### 5.1 කාර්ය සාධනය

#### 5.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබු ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ලැබී තිබු ප්‍රතිපාදනය | වියදම | උපයෝජනය ඌන/(අධි) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) උපමාන පාදක ප්‍රදාන | 370,000,000 | 348,945,781 | 21,054,219 |
| (ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 990,000,000 | 1,139,637,000 | (149,637,000) |
| (iii) වතු පාසැල් සංවර්ධන වැඩසටහන | 20,000,000 | 24,934,826 | (4,934,826) |
| (iv) ද්විතීයික පාසැල් 1000 වැඩසටහන | 52,000,000 | 60,474,818 | (8,474,818) |
| (v) වෙනත් ප්‍රදාන | | | |
| ලෝක බැංකු ආධාර - අධ්‍යාපන | 245,000,000 | 125,541,864 | 119,458,136 |

### 5.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාවූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 5,248 ක ඇස්තමේන්තු අගයකට වූ යෝජනා 10,830 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| (අ) සම්පූර්ණයෙන් නිම කළ | 9,900 | 146 | 10,046 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිම කළ | 347 | 02 | 349 |
| (ඇ) 50% කට වඩා වැඩියෙන් නිම කළ | 114 | 01 | 115 |
| (ඈ) ආරම්භකර නොතිබූ | 320 | - | 320 |
| | 10,681 | 149 | 10,830 |

### 5.1.3 විභාග ප්‍රතිඵල

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැළණිය අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසැල්වල 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ප්‍රතිශතය 2011, 2012 හා 2013 වර්ෂවල පිළිවෙලින් සියයට 10.03, සියයට 10 සහ සියයට 8.9 ක් විය.

(ආ) කැළණිය අධ්‍යාපන කලාපයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පන්ති පැවැත්වෙන පාසැල් 83 න් පාසැල් 25 ක එම විභාගය සමත්වීමේ ප්‍රතිශතය සියයට 50 ක්ද පාසැල් 58 ක එම ප්‍රතිශතය සියයට 30 ක්ද විය.

(ඇ) ගම්පහ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසැල් 06 කින් 2012 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් 43 දෙනාම අසමත්වී තිබූ අතර, පළාත් සභා පාසැල් 07 කින් 2013 වර්ෂයේ උක්ත විභාගයට පෙනීසිටි සිසුන් 83 දෙනාම අසමත්වී තිබුණි.

(ඈ) මීගමුව අධ්‍යාපන කලාපයේ කොට්ඨාශ තුනෙහි පළාත් සභා පාසැල්වල 2013 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ප්‍රතිශතය සියයට 3 සිට 7 දක්වා විය.

**5.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසැල්වල 2013 වර්ෂයේ ප්‍රාථමික අංශයේ ඉගෙනුම ලබන සිසුන් 3,314 ක් ප්‍රතිකාර්ය ඉගෙනුම් අවශ්‍යතා ඇති හා සෙමෙන් ඉගෙන ගන්නා සිසුන් බව හඳුනාගෙන තිබුණද, ඔවුන් වෙනුවෙන් ප්‍රතිකාර්ය ඉගෙනුම් වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) හෘද රෝගීන්ගේ EX-ECG පරීක්ෂණය සිදුකිරීම සඳහා EX-ECG උපකරණයක් ගම්පහ මහ රෝහලේ තිබුණද එම උපකරණය ක්‍රියාත්මක කරවීමට කාර්ය මණ්ඩලය නොමැතිවීම හේතුවෙන් අදාල පරීක්ෂණ බාහිරින් සිදුකර ගැනීමට රෝගීන්ට සිදුව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට කැළණිය අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසැල්වල ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ රු. 4,100,000 ක 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වය නම් වූ ප්‍රාථමික ශිෂ්‍ය පාදක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) පළාත් ආදායම් සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.3 වගන්තිය අනුව ආදායම් තක්සේරුකරුවන් සඳහා අවශ්‍ය යෝග්‍යතා පරීක්ෂණය, පත්වීම් දින සිට වසර තුනක කාලයක් ඇතුළත තුන්වරකට නොවැඩි වාර ගණනකදී සමත්විය යුතු වුවද 2014 ජූලි 07 දිනෙන් අවසන් වසර හතර තුළදී එක් වතාවක් පමණක් පරීක්ෂණය පවත්වා තිබූ බැවින්, ආදායම් තක්සේරුකරු තනතුරට 2010 ජූලි 07 දින උසස්වීම් ලද නිලධාරීන් 14 දෙනාගෙන් 12 දෙනෙකුටම වැටුප් වර්ධක උපයා ගැනීමට හා සේවය ස්ථිර කර ගැනීමට අදාල සුදුසුකම් සපුරා ගැනීමට නොහැකිවී තිබුණි.

(ඉ) 1980 ජනවාරි 16 දින කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරියෙකු වශයෙන් පත්වීම් ලබා 2013 මැයි 18 දින සත්ව සංවර්ධන උපදේශකවරයෙකු වශයෙන් විශ්‍රාම යාමට නියමිතව තිබූ නිලධාරියෙකුගේ සේවය ස්ථිර කර නොතිබීම හේතුවෙන් විශ්‍රාම අයදුම්පත ප්‍රතික්ෂේපවී තිබූ අතර මෙම නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුවෙහි අධ්‍යාපන සහතික කිසිවක් නොතිබුණි.

(ඊ) ජයවර්ධනපුර කලාපයේ ශ්‍රී රාහුල බාලිකා මහා විද්‍යාලයට 2013 වර්ෂය සඳහා ගුරු උපදේශකවරුන්ගේ සේවය ලැබී තිබුණේ සමහර විෂයයන් සඳහා එක් වරක් පමණක් වන අතර ගණිතය හා සිංහල විෂයයන් සඳහා දින දෙකක් පමණි. තවද විද්‍යාව, සමාජ

අධ්‍යයනය හා වානිජ විද්‍යාව විෂයයන් සඳහා ගුරු උපදේශකවරුන්ගේ සේවය ලැබී නොතිබූ බැවින් පාසැලේ විෂය සංවර්ධනයට ගුරුඋපදේශක දායකත්වය ඉතා අල්ප වී තිබුණි.

(උ) පළාත් පාසැල්වල සේවය කරන විදුහල්පතිවරුන් 09 දෙනෙක් 2013 වර්ෂයේදී කඩින්කඩ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර රාජකාරි පවරා නොතිබීම හේතුවෙන් ඔවුන්ට එම කාලය තුළ ගෙවා තිබූ රු. 971,000 ක වැටුප් නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඌ) 2012 අංක 04 දරන බස්නාහිර පළාත් ඉඩම් සංවර්ධන ප්‍රඥප්තියේ 33(1) වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාව විසින් ඉඩම් උපදේශක සභාවක් පිහිටුවිය යුතු අතර, එම උපදේශක සභාව පළාත තුළ පිහිටි පළාත් සභාව සතු ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පළාත් ප්‍රතිපත්තිය සකස් කිරීම පිලිබඳව වගකිව යුතු වූවත් එම සභාව 2014 පෙබරවාරි 28 දින තෙක් පිහිටුවා නොතිබුණි.

(එ) 2007 මාර්තු 16 දිනැති අංක 1488/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව නිත්‍ය මගී ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමට ධාවකයින් තෝරා ගත යුත්තේ, මාර්ගස්ථ මගී ප්‍රවාහනය අධිකාරිය විසින් තීරණය කරනු ලබන අවම ලංසුව සඳහන් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමක් කර ඉදිරිපත් කරනු ලබන මිල ගණන් අතුරින් වැඩිම මිල පදනම් කරගෙන වූවත්, 2013 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීමකින් තොරව අවම ලංසුව පදනම් කරගෙන වාහන තිහක් සඳහා නිත්‍ය මාර්ග බලපත්‍ර ලබාදී තිබුණි.

(ඒ) මාර්ගස්ථ මගී ප්‍රවාහනය අධිකාරිය විසින් ලොග් පත්‍ර ගාස්තු හා පිවිසුම් ගාස්තු 2013 මාර්තු 26 හා නොවැම්බර් 01 දිනයන්හිදී වැඩිකර තිබුණද, ජාතික ගමනාගමන කොමිෂම විසින් පවරා ගන්නා ලද බැස්ටියන් මාවත බස් නැවතුම්පලෙන් එකී ගාස්තු අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලොග් පත්‍ර ආදායම රු. 1,308,600 කින් හා පිවිසුම් ගාස්තු ආදායම රු. 7,692,750 කින් අඩුවී තිබුණි.

(ඔ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කාර්යභාරයන් ඉටුකිරීම වෙනුවෙන් බැස්ටියන් මාවතේ බස් නැවතුම්පලෙහි සේවය කළ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරීයේ සේවකයන් පනස් එක් දෙනෙකු වෙනුවෙන් වැටුප්, වේතන සහ අනෙකුත් ගෙවීම් සඳහා

රු.15,430,547 ක් මගී ප්‍රවාහන අධිකාරිය විසින් වැයකර තිබුණද එකී මුදල් ගමනාගමන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඕ) හෝමාගම බස් නැවතුම්පලෙහි බස් රථ ධාවන කටයුතු ආරම්භ කළ 2012 දෙසැම්බර් 10 දිනම බස් නැවතුම්පල භූමිය ගිලාබැසීම නිසා බස් රථ ධාවන කටයුතු නතර කර තිබූ අතර රු. 52,759,629 ක් වැයකර ඉදිකරන ලද හෝමාගම බස් නැවතුම්පල විවෘත කර වසර දෙකකට ආසන්න කාලයක් ගතවී ඇතත් බස් රථ ගාල්කිරීමට සුදුසු තත්ත්වයට පත්කර ගැනීමට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ක) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු සභාපතිවරුන් දෙදෙනෙකුට 2005 හා 2007 වර්ෂවලදී වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනා සහ දුරකථන ගාස්තු එකතුව රු. 432,030 ක් ආපසු අයකර ගැනීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් කළ නියෝගය පරිදි වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු වෙනුවට එම වටිනාකම ගිණුම් පොත්වලින් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කර තිබුණි.

(ග) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සේවක ණය ලබාදීමේදී හා එම ණය අයකර ගැනීමේදී චක්‍රිය අරමුදලක් මාර්ගයෙන් සිදුනොකර, බැංකුවේ තබන ලද තැන්පතුවකින් නිවාස ණය ගෙවීම හා පොදු අරමුදලින් අනෙකුත් ණය ගෙවීමද සිදුකර තිබුණි. මෙලෙස අවිධිමත් ආකාරයෙන් 2013 වර්ෂය තුළ ගෙවා තිබූ සේවක ණය රු. 75,373,389 ක් විය.

## 5.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත තුළ ඇති සමූපකාර සමිති 55 ක ගිණුම් පොත්පත් අසම්පූර්ණ වීම නිසා වර්ෂ 11 පමණ කාලයක සිට එම සමිතිවල ගිණුම් සමූපකාර කොමසාරිස්ගේ පරීක්ෂාවට ලක්ව නොතිබුණි.

(ආ) පළාත් ඉඩම් දෙපාර්තමේතුව විසින් දීර්ඝකාලීන බදු පදනම මත පෞද්ගලික සමාගම්වලට ලබාදී තිබූ ඉඩම් 09 කින් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හිඟ බදු මුදල රු.41,597,047 ක් විය.

**5.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස සියළු රාජ්‍ය සේවකයින් සඳහා ක්‍රියාත්මක කරනු ලබන අග්‍රහාර රක්ෂණ ක්‍රමය පවතිද්දී, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සියළු නිලධාරීන් සඳහා "සුපසන් ගුරු පවුර" නමින් සමූහ ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබූ අතර මෙහිදී පළමු අදියර සඳහා පළාතේ පාසැල්වල සහ අධ්‍යාපන කාර්යාලවල සේවයේ නියුතු විදුහල්පතිවරුන්, ගුරුභවතුන් හා නිලධාරීන් 5,225 ක් සඳහා එක් අයෙකු වෙනුවෙන් වාර්ෂික දායකත්වය ලෙස රු. 900 බැගින් රු. 4,702,500 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත 2013 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. තවද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ආරම්භක කටයුතු හා දැනුවත් කිරීම් සඳහා රු. 156,620 ක අමතර වියදමක්ද දරා තිබුණි.

(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතුව පැවති බැස්ටියන් මාවතේ වැසිකිළි පද්ධතිය අධිකාරියේ එකඟතාවයකින් තොරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2010 ඔක්තෝබර් මාසයේදී මිල ගණන් කැඳවා බදු දී තිබුණි. මගී අධිකාරිය එම වැසිකිළි පද්ධතිය බදුදීම තුළින් මසකට රු. 475,000 ක් ඉපයීම් කළ ද 2010 වර්ෂයේ සිට 2013 වර්ෂයේ අවසානය දක්වා එමගින් අධිකාරියට අහිමි වූ ආදායම රු. 18,050,000 ක් විය.

(ඇ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වර්තමානයේ රථගාල ලෙස භාවිතා කරන පෞද්ගලික ආයතනයකට හිමි පර්චස් 32.4 ක් විශාල වූ ඉඩම පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය නොලබා අධිකාරියේ කාර්යාල පහසුකම් පුළුල් කිරීම හා රථගාල ඉදිකිරීම සඳහා මිලට ගැනීමට යෝජිතව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් රුපියල් මිලියන 146 කට තක්සේරු කර තිබුණු අතර සියයට 50 ක අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා අධිකාරිය විසින් අදාල සමාගම සමඟ ලිඛිත එකඟතාවයකට පත්ව තිබුණි.

(ඈ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත මගින් පවරන ලද බලතලවලට හානියක් නොමැතිව නියෝග සෑදිය යුතු අතර නියෝග සෑදිය යුතු කාරණා 09 ක් මෙම පනතේ 18(2) වගන්තිය මගින් පැහැදිලිව දක්වා තිබුණි. එහෙත් එම කාරණාවලට ඇතුළත් නොවන, මෙම පනතේ 3(5) වගන්තියට අනුව එක් එක් පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ ආදායම් එකතු කිරීමේ බලයට අනුකූල නොවන පරිදි 2007 මාර්තු 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්

පත්‍රයේ, පළාත් සභාවට ලැබිය යුතු ආදායම පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට හිමිවන ලෙසින් සඳහන් කර තිබුණි. තවද ඉහත ගැසට් නිවේදනය අනුව 2013 වර්ෂය සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස පළාත් සභාවට ලැබිය යුතු රු. 4,689,500 ක් අයකරගෙන නොතිබුණි.

## 5.5 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් විධිමත් තක්සේරු වාර්තාවක් හා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් නොමැතිව පාවිච්චි කරන ලද ඩෝසර් යන්ත්‍රයක් රුපියල් මිලියන 5 ක් ගෙවා පළාත් පාලන ආයතනයකින් ලබාගෙන තිබූ අතර මෙම යන්ත්‍රය මිලට ගෙන පැය 1,454 ක ක්‍රියාකාරීත්වයකින් පසු භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.

(ආ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් මිලියන 246 ක් වැයකර 2012 වර්ෂයේදී පන්නල හා වගවත්ත යන ස්ථානවල ඇස්පෝල්ට් යන්ත්‍රාගාර 02 ක් ස්ථාපිත කර තිබූ අතර ස්ථාපිත කරන ලද අවස්ථාවේ සිට 2013 සැප්තැම්බර් 30 දින දක්වා අක්‍රීය කාලය පිළිවෙලින් පන්නල සඳහා දින 306 ක් හා වගවත්ත සඳහා දින 235 ක් විය. මේ සඳහා මසකට දැරිය යුතු ස්ථාවර පොදු කාර්ය පිරිවැය දළ වශයෙන් මිලියන 03 ක් වන බැවින් අක්‍රීය කාලය සඳහා දරන ලද රුපියල් මිලියන 51 ක වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.

## 5.6 අවිධිමත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ පවිත්‍රතා කටයුතු සඳහා 2013 ජුනි 30 දින දක්වා තෝරාගෙන තිබූ කොන්ත්‍රාත්කරුගේ සේවය අසතුටුදායක බව වෛද්‍ය අධිකාරී විසින් 2013 ජුනි මාසයේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දන්වා තිබුණද එම කොන්ත්‍රාත්කරුගේ සේවය නැවත වරක් 2013/2014 වර්ෂය සඳහා රු. 17,455,357 ක්වූ වටිනාකමකට ලබාගැනීමට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ගිවිසුම් අත්සන් කර තිබුණි.

(ආ) ආණ්ඩුකාරවරයාගේ කාර්යාලය සඳහා සුදුසු ගොඩනැගිල්ලක් කුලියට ලබාගැනීමේදී ජාතික ප්‍රසම්පාදන චක්‍රලේඛ අංක 08 හි දක්වා තිබූ නියමිත දින ගණන් ලබානොදී කළ තරඟකාරී ලංසු කැඳවීමේදී ඉදිරිපත් කර තිබූ එකම ලංසුවද, ගොඩනැගිල්ලේ අයිතිය

තහවුරු කර ගැනීමට නොහැකිවීම මත ප්‍රතික්ෂේප වී තිබූ අතර පුවත්පතක පලවී තිබූ දැන්වීමක් මත අවිධිමත් ආකාරයෙන් පසුව තෝරාගෙන තිබූ ගොඩනැගිල්ල අවශ්‍ය පිරිවිතරයන්ට නොගැලපෙන්නක් විය.

(ඇ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ උපදේශක කාරක සභා සාමාජිකයින් 2013 පෙබරවාරි 28 සිට මාර්තු 05 දක්වා ඊජිප්තු සංචාරයකට සහභාගී වී තිබූ අතර එම අයගේ පවුල්වල සාමාජිකයන් 06 දෙනෙකු වෙනුවෙන් පළාත් සභා අරමුදලින් රු. 426,676 ක් වැයකර තිබුණි. තවද සංචාරයට සහභාගී වූ සාමාජිකයන් හා නිලධාරීන්ගේ නවාතැන් හා ප්‍රවාහන පහසුකම් සඳහා සංචාරයට පෙර රු. 2,514,488 ක් ඊජිප්තුවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත ගෙවා තිබියදී 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2010/01 ට පටහැනිව සංචාරයට සහභාගී වූ කාරක සභා සාමාජිකයින්ට හා නිලධාරීන්ට සංයුක්ත හා අනියම් දීමනා වශයෙන් රු. 1,196,345 ක්ද ගෙවා තිබුණි.

## 5.7 නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගුණාත්මක යෙදවුම් වෙනුවෙන් 2013 හා පෙර වර්ෂ වෙනුවෙන් ගම්පහ අධ්‍යාපන කලාපයේ පාසැලකට හා කළුතර කලාපයේ පාසැලකට ලබාදී තිබූ මුදල්වලින් රු.3,114,590 ක් වියදම් නොකිරීම නිසා 2013 දෙසැම්බර් 31 දිනටත් ඉතිරිව තිබුණි.

(ආ) මොල්ලිගොඩ ආයුර්වේද රෝහලේ 2012 මාර්තු 11 දින විවෘත කරන ලද වටිනාකම රු.1,769,310 ක්වූ එක්ස් කිරණ ඒකකය 2013 දෙසැම්බර් 04 දින වන විටත් ආරම්භ නොකර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) 2013 වර්ෂයේ නිෂ්පාදනය කළ රු. 3,955,765 ක් වටිනා බස් මගී ආවරණ නවයක් 2014 ජුනි 25 වන විටත් අදාල ස්ථානවල සවිකර නොතිබුණි.

## 5.8 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැළණිය අධ්‍යාපන කලාපයේ ප්‍රාථමික හා ද්විතීයික පාසැල් 34 ක දේපළ සොරාගැනීම හේතුවෙන් රු. 2,243,948 ක හානි හා පාඩු වාර්තා වී තිබුණි. මෙම හානි හා පාඩුවලින් රු.2,181,060 ක් වර්ෂ 1-10 දක්වා කාල පරාසයකටද රු. 62,888 ක් වර්ෂ 10 කට වැඩි

කාලයකටද අයත් වූ අතර මේ පිළිබඳව මුදල් රෙගුලාසි / පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කිරීම මන්දගාමී තත්ත්වයක තිබුණි.

(ආ) ගම්පහ මහ රෝහලේ ඖෂධ ගබඩාවේ 2013 දෙසැම්බර් අවසානය වනවිට වටිනාකම රු.917,845 ක්වූ වර්ග 16 කට අයත් ඖෂධ 196,503 ක් කල්ඉකුත්වීමෙන් සහ රු.2,409,305 ක්වූ වර්ග 17 කට අයත් ඖෂධ 20,554 ක් ප්‍රමිතියෙන් තොර ඖෂධ බවටද හඳුනාගෙන තිබීම මත එකතුව රු. 3,327,150 ක පාඩුවක් සිදුව තිබුණි.

(ඇ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 1990 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක ආයෝජනය කර තිබූ රු. 453,009,391 ක මුදල අදාල බැංකුව වසා දැමීම හේතුවෙන් අධිකාරියට නැවත ලබා ගැනීමට නොහැකි වී තිබූ අතර මුදල මේ දක්වා ශේෂ පත්‍රයෙහි ජංගම නොවන වත්කම් යටතේ ආයෝජන ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 5.9 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

ගම්පහ දිස්ත්‍රික් මහ රෝහලේ නේවාසික රෝගී වාට්ටු සඳහා රුපියල් මිලියන 450 ක් වැයකර 2000 වර්ෂයේදී වැඩ නිමකර තිබූ මහල් 08 කින් යුත් ගොඩනැගිල්ලේ එක් එක් මහලේ වැසිකිළි / නානකාමරවල අපවිත්‍ර ජලය කොන්ක්‍රීට් ස්ලැබ්‍රයන් (Slab) හරහා ගලාගොස් ගොඩනැගිල්ලේ විවිධ ස්ථානවලින් පිටතට කාන්දුවීමට පටන්ගෙන තිබීම මත ගොඩනැගිල්ල ඇතුළත අනාරක්ෂිත තත්ත්වයක් ඇතිවී තිබෙන බව අනාවරණය වී තිබුණි.

## 5.10 අරමුණුවලට පටහැනි ව්‍යාපෘති

--------------------------------

"කෘෂිකාර්මික සංවර්ධන කටයුතු, කෘෂි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය හා ගොවිජන සංවර්ධනය සඳහා පියවර ගැනීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම හා වෘත්තීය පුහුණු ආයතන මඟින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සුළු වාරිමාර්ග ක්‍රම සංවර්ධනය හා නඩත්තුව, පරිසර කටයුතු ප්‍රවර්ධන සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම" කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් වුවද, ඊට අයත් නොවන රු. 87,205,450 ක්වූ ව්‍යාපෘති 04 ක් 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි.

**5.11 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

-------------------------------------------

2013 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් රුපියල් මිලියන 04 ක් වෙන්කර තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල් කොමිෂන් සභා ලේකම්ගේ 2013 අගෝස්තු 08 දිනැති අංක එෆ්සී/ඩබ්ලිව්පී/4/6/2013 දරන ලිපිය ප්‍රකාරව සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී දිස්ත්‍රික්ක 03 ටම සමූපකාර අංශයේ සංවර්ධනය කෙරෙහි අවධානය යොමුකිරීම අත්‍යාවශ්‍ය බව පෙන්වා දී තිබුණද කොළඹ දිස්ත්‍රික්කයේ නගර 05 ක් ආශ්‍රිතව පමණක් ව්‍යාපෘති තෝරාගෙන තිබුණි.

(ආ) තෝරාගත් දිළිඳු පවුල්වල ජීවනෝපාය සංවර්ධනය උදෙසා "මහරගම විවිධ සේවා සමූපකාර සමිති ප්‍රධාන කාර්යාල භූමියේ දිවි නැඟුම පොල යටිතල පහසුකම් සංවර්ධනක කිරීම ව්‍යාපෘතියේ" ව්‍යාපෘති නාමය "මොරටුව විවිධ සේවා සමූපකාර සමිතියට අයත් මෝල්පේ කෝප්සිටි දින පොල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම" වශයෙන් සංශෝධනය කර තිබුණද මේ සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලැබී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර 2013 දෙසැම්බර් 31 දින රුපියල් මිලියන දෙකක චෙක්පත ආපසු යවා තිබුණි.

(ඇ) කිරි පාරිභෝජනය ප්‍රචලිත කිරීමේ පහසුකම් සැලසීම යටතේ කිරි අලෙවිසැල් 03 ක් එකක් රු. 350,000 ක ඇස්තමේන්තුවක් යටතේ ඉදිකිරීමට 2013 දෙසැම්බර් 22 දින රුපියල් මිලියන 01 ක් සී/ස කොළඹ දකුණ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබාදී තිබූ අතර මෙම අලෙවිසැල් හෝමාගම දුම්රිය ස්ථානය අසළ, රුක්මල්ගම නිවාස සංකීර්ණය අසළ හා මාලඹේ බස් නැවතුම අසළ ඉදිකර තිබුණි. එහෙත් එම කිරිහල් ස්ථාපිත කර ඇති ස්ථාන බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් වන හෙයින් එම කිරිහල් සමූපකාර සමිතිවලට පැවරීමට ක්‍රමවේදයක් නොමැති බව පවසා ඒවා එම අධිකාරියට පවරා තිබුණි.

(ඈ) මහරගම විවිධ සේවා සමූපකාර සමිතියට අයත් එගොඩවත්ත ග්‍රාමීය බැංකු ගොඩනැගිල්ලෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබූ අතර වැඩ ආරම්භ කිරීම සඳහා සියයට 20 ක අත්තිකාරමක් පමණක් ලබාදිය යුතු වුවත් මුළු ඇස්තමේන්තුව වන රු. 1,250,000 න් රු.500,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් 2013 දෙසැම්බර් 20 දින සී/ස මහරගම

විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදී තිබුණි. තවත් රු. 500,000 ක චෙක්පතක් 2013 දෙසැම්බර් 31 දින ලියා තිබුණු අතර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ බැවින් 2014 අප්‍රේල් 30 වන විටත් එම චෙක්පත රඳවා ගෙන තිබුණි.

**5.12** **වාහන පරිපාලනය**

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන ලේකම්ගේ 2008/2009 වාහන අළුත්වැඩියා කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ පිළිවෙලින් රු. 1,104,500 ක් හා රු. 1,537,600 ක් වැයකර අළුත්වැඩියා කර තිබූ කාර් රථයක් හා ජීප් රථයක් 2013 නොවැම්බර් 23 දින පිළිවෙලින් රු. 400,000 කට හා රු.900,000 කට තක්සේරු කර පිළිවෙලින් රු. 377,785 කට හා රු. 932,000 කට ටෙන්ඩර් මඟින් අපහරණය කර තිබුණි.

(ආ) 1990 වර්ෂයේ සිට පළාත් සභාවට විධිමත්ව පවරාගෙන නොතිබූ කැබ් රථයක් ප්‍රධාන ලේකම්ගේ 2008/2009 වාහන අළුත්වැඩියා කිරීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ රු.2,014,000 ක් වැය කර අළුත්වැඩියා කර තිබූ අතර කිලෝ මීටර 42,970 ක් ධාවනය කිරීමෙන් පසු 2013 සැප්තැම්බර් මාසයේදී වාහන අපහරණ ලැයිස්තුවට ඇතුළත් කර 2014 මාර්තු මාසයේදී අදාල රේඛීය අමාත්‍යාංශයට ආපසු භාරදී තිබුණි.

(ඇ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන උපයෝජනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) 2012 නොවැම්බර් 13 දිනැති අංක 01/2012 දරන බස්නාහිර පළාත් ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන සඳහා හිමිකම් ලබන නිලධාරීන් 05 දෙනෙකු සඳහා 2011 සිට 2014 මාර්තු දක්වා අනුමත මාසික ඉන්ධන සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව රු. 7,869,440 ක් වටිනා ඉන්ධන ලබාදී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 හි සඳහන් වගන්ති සාවද්‍ය ලෙස අර්ථකතනය කර නිලධාරීන් 12 ක් සඳහා ඉන්ධන ලීටර් 300 සිට 450 දක්වා සීමාවක් අනුමත කර වාහනවල භාරකාරත්වය ලබාදී තිබුණි. එම අවිධිමත් අධිකාරී බලය උපයෝගී කරගෙන, නිල වාහනයක් භාවිතා කිරීම සඳහා විධිමත් අනුමැතිය ලබානොගත් නිලධාරීන් 22 ක් තම නිවසට යාමට, ඒමට හා පෞද්ගලික කටයුතු සඳහා පූර්ණකාලීනව එම වාහන භාවිතා කරමින් තිබූ අතර 2011 සිට 2014 මාර්තු

දක්වා නිවසට යාමට හා ඒමට භාවිතා කළ ඉන්ධනවල වටිනාකම පමණක් රු. 6,034,496 ක් විය.

(iii) 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව කුලී පදනම මත ලබාගන්නා වාහන සඳහා ගෙවිය හැකි වැට් බදු රහිත මාසික උපරිම කුලිය රු. 40,000 ක් වුවද මාසික කුලිය රු. 50,000 සිට රු. 100,000 දක්වා ලබාගත් කුලී වාහන 13 ක් වෙනුවෙන් 2011 සිට 2014 අප්‍රේල් දක්වා රු.795,000 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(iv) අඩු ඉන්ධන කාර්යක්ෂමතාවයකින් යුතු වාහන 05 ක් කුලී පදනම මත ලබාගැනීම නිසා අධිකාරියට දැරීමට සිදු වූ අතිරේක පිරිවැය රු. 1,029,600 කි.

## 5.13 කාර්යමණ්ඩල පරිපාලනය

### 5.13.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 2,245 | 2,213 | 32 |
| **තෘතීය** | 901 | 618 | 283 |
| **ද්විතීය** | 10,027 | 7,795 | 2,232 |
| **ප්‍රාථමික** | 4,670 | 4,537 | 133 |
| **එකතුව** | 17,843 | 15,163 | 2,680 |

**(ආ) පාසැල් කාර්ය මණ්ඩල**

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,732 | 1,692 | 40 | - |
| ගුරුභවතුන් | 34,374 | 31,991 | 2,383 | - |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 1,051 | 2,455 | - | 1,404 |
| | 37,157 | 36,138 | 2,423 | 1,404 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඉහළ කළමනාකරණ තනතුරු ඇතුළු විවිධ තනතුරුවල සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුකාරවරයාගේ/පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගෙන තිබු අතර, ඉහළ ශ්‍රේණිවල පුරප්පාඩු තනතුරුවලට වැඩ බලන නිලධාරීන් පත් කිරීම දිගින් දිගටම සිදුව තිබුණි.

(ආ) පළාත් අමාත්‍යවරුන් සඳහා අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩලයට උපදේශක තනතුරු ඇතුළත්ව නොතිබියදී පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත 2008 ජනවාරි සිට 2013 ජනවාරි දක්වා විටින් විට ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු සියළු අමාත්‍යවරුන් සඳහා උපදේශකවරුන් පත්කර රු. 30,000 බැගින් මාසික දීමනාවක් සහ වාහන දීමනා, ඉන්ධන දීමනා, දුරකථන දීමනා වැනි අනෙකුත් වරප්‍රසාද ද ලබාදී තිබුණි.

(ඇ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට කොන්ත්‍රාත් හා තදුචිත පදනම යටතේ පිළිවෙලින් 271ක් හා247 ක්ද, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට 52ක්, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට 34ක් හා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයට 06ක් කොන්ත්‍රාත් පදනම යටතේද සේවකයින් බඳවාගෙන තිබුණි.

(ඈ) අනුමත බඳවාගැනීමේ පටිපාටිය හා අයදුම්පත් කැඳවීමේ පුවත්පත් නිවේදනය අනුව අවම සුදුසුකම් සපුරා නොතිබූ අයෙක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුරට 2013 නොවැම්බර් 01 දින බඳවාගෙන තිබුණි.

(ඉ) මාර්ගස්ථ මගී ප්‍රවාහනය අධිකාරියේ මහජන සම්බන්ධතා නිලධාරී සහ උප විදුහල්පති තනතුරු සඳහා එක් අභ්‍යන්තර අයදුම්කරුවකු බැගින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී තිබූ අතර එම අයදුම්කරුවන් අදාල තනතුරු සඳහා තිබිය යුතු මූලික සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණ වාර්තාවල සඳහන්ව තිබුණද, සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ නිලධාරීන්ටම අදාල තනතුරු පිරිනමා තිබුණි.

(ඊ) අභ්‍යන්තර විගණන අංශය සඳහා 2010 දෙසැම්බර් 31 දිනට අනුමතව පැවති විගණන නිලධාරී තනතුරු විසිපහ , 13 ක් ලෙස හා කළමනාකරණ සහකාර තනතුරු හතර, 16ක් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ලවා සංශෝධනය කරවාගෙන පළාත් සභාවේ විවිධ කාර්යාලවල සේවයේ නියුතු කළමනාකරණ සහකාර නිලධාරීන් 08 දෙනෙකු හා නවක නිලධාරීන් 04 දෙනෙකු 2013 ඔක්තෝබර් මාසයේදී අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර තිබූ අතර මෙම අනුයුක්ත කිරීම ආණ්ඩුකාරවරයා විසින් 2006 සැප්තැම්බර් 27 දිනෙන් අනුමත දැනට ක්‍රියාත්මකව පවතින අභ්‍යන්තර විගණන අංශය සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ 3.3 වගන්තියට පටහැනි විය. මෙලෙස අනුයුක්ත කරගෙන කිසිදු පුහුණුවක් නොලැබූ කළමනාකරණ සහකාරවරුන්ට හා අභ්‍යන්තර විගණන නිලධාරින් වශයෙන් කටයුතු කරන නිලධාරීන්ටද විගණන වැඩසටහන් නොමැතිව පළාත් සභාවේ විවිධ කාර්යාල විගණනය සඳහා කාර්ය නියමයන් පවරා තිබුණි. තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියාගේ තනතුර ප්‍රධාන අභ්‍යන්තර විගණක වූ නමුත්, අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) වශයෙන් භාවිතා කරමින් තිබුණි.

## 5.14 පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබුණි. තවද, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාචනය කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය ඇතුළුව ආසන්න වසර 04ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාවනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | අහිතකර මතයන් ප්‍රකාශ කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|---|
| -------- | ------------------- | -------------------- | ------------ |
| 2009 | 48 | 22 | - |
| 2010 | 48 | 13 | - |
| 2011 | 48 | 20 | - |
| 2012 | 48 | 26 | - |
| 2013 | 48 | 03 | 26 |

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පළාත් පාලන බල මණ්ඩල 48 හි හිඟ ආදායම රු. 4,176,603,708 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 12 ක නිලධාරින්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු. 31,248,292 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල වල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර / පවත්වා නොතිබුණි.

## 6 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණන

--------------------

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන වැඩසටහන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පළාත්සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු16ක ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොතිබුණි.

### 6.3 විගණකාධිපතිවරයාගේ වාර්තා සභාගත කිරීම.

----------------------------------------------------

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2008 | 2009.12.10 | 2010.02.09 |
| 2009 | 2010.10.26 | 2013.01.08 |
| 2010 | 2012.01.16 | 2012.05.22 |
| 2011 | 2013.02.28 | 2013.12.03 |
| 2012 | 2014.08.27 | සභාගත කර නැත |

## 6.4 බැංකු ගිණුම්

බැංකු ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එක් අමාත්‍යාංශයක ජංගම ගිණුම් 02 ක බැංකු සැසඳුම් පිළියෙල කිරීමේදී මාස 1 - 2 දක්වා ප්‍රමාදයක් තිබුණි.

(ආ) ආයතන 04 ක බැංකු ජංගම ගිණුම් 04 ක මාස 06 ඉක්මවූ උපලබ්ධි නොවූ තැන්පතු වල වටිනාකම රු. 647,534 ක් විය.

(ඇ) ආයතන 02 ක බැංකු ජංගම ගිණුම් 10 කට අදාලව ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු. 669,075 ක් වූ චෙක්පත් 100 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) ආයතන 01 ක බැංකු ජංගම ගිණුම් 05 කට අදාලව හඳුනානොගත් හර රු. 37,900 ක් හා හඳුනානොගත් බැර රු. 233,665 ක් විය.

(ඉ) එක් ආයතනයක එක් බැංකු ගිණුමක රු. 208,051 ක් වටිනා අහරු චෙක්පත් 25 ක් සම්බන්ධයෙන් මු.රෙ. 486 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම
(ඈ) අභ්‍යන්තර විගණනය
(ඉ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය
(ඊ) සේවක මණ්ඩල